DOI : 10.31357/fhssmph.2014.00730

# ප්‍රාථමික අධ්‍යාපන සාධනය කෙරෙහි සමාජ ස්තරායනයේ බලපෑම

# (බස්නාහිර පළාතේ ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය ඇසුරෙන්)

චන්දිමා ජීවනී දැඩිගමුව

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දර්ශනපති පරීක්ෂණය සඳහා

සමාජ විද්‍යාව විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය.

**අපේක්ෂකයාගේ ප්‍රකාශය**

මේ ශාස්ත්‍රීය නිබන්ධය මහාචාර්ය බී. ඒ. ටෙනිසන් පෙරේරා මහතාගේ හා ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සදහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

21/07/14 ..................................

දිනය

..................................

අත්සන

## උපදේශකවරුන්ගේ සහතිකය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගයීම් කාර්යය සදහා විශ්වවිද්‍යාලයකට ඉදිරිපත් කිරිමට සුදුසු බවත් නිර්දේශ කරමු.

01 2014 – 7 – 21 ........................ ........................

දිනය                                   අත්සන

02 2014 – 7 – 21 ........................ ........................

දිනය                                   අත්සන

## පටුන


| | පිටු අංක |
|---|---|
| මාතෘකාව | i |
| අපේක්ෂකයාගේ ප්‍රකාශය | ii |
| උපදේශකවරුන්ගේ සහතිකය | iii |
| පටුන | iv - vii |
| වගු හා ප්‍රස්ථාර | viii- x |
| රූප සටහන් | xi |
| ස්තුතිය | xii |

**පළමුවැනි පරිච්ඡේදය**

| | |
|---|---|
| 1. හැඳින්වීම | 01 - 05 |
| 1.1 අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු | 05 |
| 1.2 පර්යේෂණ ගැටළුව | 06 |
| 1.3 උපන්‍යාසය | 07 |
| 1.4 අධ්‍යයන ක්ෂේත්‍රය | 07 |
| 1.5 නියැදිකරණය හා දත්ත රැස්කිරීම | 08 - 09 |
| 1.6 අධ්‍යයනයේ සීමා | 09 |
| 1.7 අධ්‍යයනයේ දුෂ්කරතා | 09 - 10 |
| 1.8 පරිච්ජේදකරණය | 10 - 11 |

**දෙවැනි පරිච්ඡේදය**

| | |
|---|---|
| 2. ප්‍රාථමික අධ්‍යාපනය හැඳින්වීම | 12 - 59 |
| 2.1 ප්‍රාථමික අධ්‍යාපනය | 12 - 20 |
| 2.2 සාධනය | 21 - 30 |
| 2.3 සමාජ ස්තරායනය | 30 - 36 |

2.4 ශ්‍රී ලාංකීය සමාජයේ සමාජ ස්තරායනයේ වෙනස් වීම 36 - 38

2.5 සමාජ ස්තරායනය හා අධ්‍යාපනය 38 - 41

2.6 සමාජ පන්තිය 41 - 50

2.7. අධ්‍යාපනය කෙරෙහි සමාජ පන්තියේ බලපෑම 50 - 66

2.7.1 ශිෂ්‍ය සාධනය හා සමාජ පන්තිය 56 - 57

2.7.2 පාසල් වර්ගය හා සමාජ පන්තිය 57 - 58

2.7.3 විෂයධාරා තෝරා ගැනීම හා සමාජ පන්තිය 58 - 59

## තුන්වැනි පරිච්ඡේදය

3. ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපනයේ ආරම්භය හා විකාශනය 60 - 116

3.1 ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ඓතිහාසික පසුබිම 60 - 61

3.2 ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති හා පසුබිම 61 - 65

3.3 ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපනයේ ආරම්භය හා සමාජ විෂමතා 66 - 73

3.4 1948 ට පෙර අධ්‍යාපන පරිපාලන පසුබිම 73 - 74

3.5 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය සඳහා ඉල්ලුම 75 - 89

3.6 විසිවන සියවසේ අධ්‍යාපන අවධි සහ ප්‍රාථමික පාසල් 89 - 97

3.7 නූතන පාසල් ව්‍යුහය සහ වර්ගීකරණය 97 - 107

3.8 නව ප්‍රතිසංස්කරණ හා පාසල් විෂය මාලාව 108 - 109

3.9 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රවණතා 109 - 116

## හතරවැනි පරිච්ඡේදය

4. දත්ත ඉදිරිපත් කිරිම හා විශ්ලේෂණය 117 - 170

4.1 අධ්‍යයන ක්ෂේත්‍රය හැඳින්වීම 117 - 119

4.2 ක්‍රියාත්මක නිර්වචන 119

4.2.1 සමාජ පන්තිය 119 - 120

4.3 පාසල් සිසුන් පිළිබඳ විග්‍රහය 121

4.4 සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ විග්‍රහය 121 - 126

4.5 ශිෂ්‍ය සාධනය පිළිබඳ ගුරුවරුන්ගේ අදහස් 127 - 131

4.6 ශිෂ්‍ය සාධනය හා සමාජ පන්තිය පිළිබඳ විදුහල්පතිවරුන්ගේ අදහස් 122 - 133

4.7 ශිෂ්‍ය සාධන තත්ත්වයන් පිළිබඳ අධ්‍යාපන නිලධාරීන්ගේ අදහස් 133 - 135

4.8 දෙමාපියන්ගේ දත්ත විග්‍රහය 135 - 146

4.8.1 දෙමාපියන්ගේ අධ්‍යාපන තත්ත්වය 138 - 141

4.8.2 දෙමාපියන්ගේ රැකියා ක්ෂේත්‍ර හා ආදායම් තත්ත්වය 141

4.8.2.1 පියාගේ රැකියා ක්ෂේත්‍රය හා ආදායම් තත්ත්වය 141 - 143

4.8.2.2 මවගේ රැකියා ක්ෂේත්‍රය හා ආදායම් තත්ත්වය 143 - 146

4.9 දෙමාපියන්ගේ නිවසේ භෞතික පිහිටීම 147 - 150

4.10 ශිෂ්‍ය සාධන තත්ත්වයන් කෙරෙහි පවුලේ අවධානය 151 - 156

4.13 සිසුන්ගේ අධ්‍යාපන සාධනය හා අනෙකුත් විචල්‍යයන් අතර

පවතින සබඳතාවය 156 - 170

4.11.1 ශිෂ්‍ය සාධනය හා නිවසේ භෞතික පරිසරයේ ස්වභාවය 157 - 158

4.11.2 දෙමාපිය අධ්‍යාපන තත්ත්වය හා ශිෂ්‍ය සාධනය 158 - 159

4.11.3 දෙමාපිය දූදරු සබඳතාවය හා ශිෂ්‍ය සාධනය 159 - 160

4.11.4 දෙමාපිය රැකියාව හා ශිෂ්‍ය සාධනය 161 - 165

4.11.5 පවුලේ සාමාජිකයන් මත්ද්‍රව්‍ය භාවිතය හා ශිෂ්‍ය සාධනය 165 - 166

4.11.6 ශිෂ්‍ය සාධනය හා රූපවාහිනිය නැරඹීම 166 - 167

4.11.7 අමතර පන්ති සහභාගීත්වය හා ශිෂ්‍ය සාධනය 167 - 168

4.11.8 සිසුන් දිනපතා පාසල් පැමිණීම හා ශිෂ්‍ය සාධනය 168

4.11.9 සමාජ පන්තිය හා ශිෂ්‍ය සාධනය 168 - 170

**පස්වැනි පරිච්ඡේදය**

5. නිගමන හා යෝජනා 171 - 181

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 182 - 192

උප ග්‍රන්ථ 01

- ප්‍රශ්නාවලීන්
- ක්ෂේත්‍ර අධ්‍යයනයේ ඡායාරූප

## වගු හා ප්‍රස්ථාර සටහන්

- වගු

**දෙවැනි පරිච්ඡේදය**


වගු අංක 2.1 විවිධ රටවල ප්‍රාථමික පාසලට දරුවන් ඇතුළත් කර ගන්නා වයස් මට්ටම් 15


**තුන්වැනි පරිච්ඡේදය**


වගු අංක 3.1 රජයේ සහ ආධාර ලබන පාසල් 1900 දී පළාත් අනුව ව්‍යාප්තිය 67

වගු අංක 3.2 පාසල් අධ්‍යාපනය ව්‍යාප්ත වූ අන්දම 75

වගු අංක 3.3 අවුරුදු 30 ක් තුළ අධ්‍යාපන සාධන මට්ටම වෙනස් වීම 77

වගු අංක 3.4 ශ්‍රී ලංකාවේ රජයේ පාසල් සංඛ්‍යාව 2005 - 2009 79

වගු අංක 3.5 පෞද්ගලික පාසල් හා පිරිවෙන් සංඛ්‍යාව 80

වගු අංක 3.6 රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව 2005 - 2009 81

වගු අංක 3.7 පාසල් වර්ගීකරණ ව්‍යාප්තිය - 2003 100

වගු අංක 3.8 ශිෂ්‍ය ප්‍රමාණය අනුව රජයේ පාසල්වල විසිරීම 103

වගු අංක 3.9 ක්‍රියාත්මක වන ශ්‍රේණි අනුව රජයේ පාසල් - 2006 104

වගු අංක 3.10 ශිෂ්‍ය ජනගහනයේ ප්‍රමාණය අනුව රජයේ පාසල් සංඛ්‍යාව - 2006 104

වගු අංක 3.11 ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල අධ්‍යාපන මට්ටම හා සංසන්දනාත්මක විග්‍රහයක් 115


**හතරවැනි පරිච්ඡේදය**


වගු අංක 4.1 අධ්‍යයන කළ පාසල්වල ගුරු සිසු සංඛ්‍යාව 117

වගු අංක 4.2 දත්ත දායකයන්ගේ වයස් මට්ටම 137

වගු අංක 4.3 පවුල් සංස්ථාවල මාසික ආදායම් තත්ත්වය 145

වගු අංක 4.4 දරුවන් අමතර පන්ති යැවීම සඳහා ගත කරන කාලය 152

වගු අංක 4.5 දරුවන් රූපවාහිනිය නැරඹීමට ගත කරන කාලය 154

වගු අංක 4.6 දෙමාපිය දූදරු සබඳතාවය 159

වගු අංක 4.7 දෙමාපිය රැකියාව අනුව ඒ ඒ සමාජ පන්තිවලට අයත් දරුවන් සංඛ්‍යාව 169

- ප්‍රස්ථාර

**දෙවැනි පරිච්ඡේදය**

ප්‍රස්ථාර අංක 2.1 සමාජ පන්තිය හා අධ්‍යාපන ප්‍රාප්තිය 51

**තුන්වැනි පරිච්ඡේදය**

ප්‍රස්ථාර අංක 3.1 1914-1929 කාලයේ පාසල් පද්ධතියේ පැවති අධ්‍යාපන තල 90

ප්‍රස්ථාර අංක 3.2 1930 ගණන්වල පාසල් පද්ධතිය 91

ප්‍රස්ථාර අංක 3.3 1960-1967 අතර පාසල් පද්ධතිය 92

ප්‍රස්ථාර අංක 3.4 1929 - 1967 වර්ෂවල පාසල් වර්ගීකරණය සංසන්දනය කිරීම 93

ප්‍රස්ථාර අංක 3.5 1972 ට පෙර පාසල්වල ව්‍යුහය 94

ප්‍රස්ථාර අංක 3.6 1972- 1978 කාලය අතරතුර පාසල්වල ව්‍යුහය 96

**හතරවැනි පරිච්ඡේදය**

ප්‍රස්ථාර අංක 4.1 සිංහල විෂය සඳහා ශිෂ්‍ය සාධන මට්ටම 122

ප්‍රස්ථාර අංක 4.2 ගණිතය විෂය සඳහා ශිෂ්‍ය සාධන මට්ටම 122

ප්‍රස්ථාර අංක 4.3 පරිසරය විෂය සඳහා ශිෂ්‍ය සාධන මට්ටම 123

ප්‍රස්ථාර අංක 4.4 ඉංග්‍රීසි විෂය සඳහා ශිෂ්‍ය සාධන මට්ටම 124

ප්‍රස්ථාර අංක 4.5 බුද්ධ ධර්මය විෂය සඳහා ශිෂ්‍ය සාධන මට්ටම 124

ප්‍රස්ථාර අංක 4.6 එක් එක් විෂයන් සඳහා ලකුණු 80 ට වැඩියෙන් ලබා සිටි සිසුන් 125

ප්‍රස්ථාර අංක 4.7 එක් එක් විෂයන් සඳහා ලකුණු 20 ට අඩුවෙන් ලබා සිටි සිසුන් 126

ප්‍රස්ථාර අංක 4.8 ශිෂ්‍ය සාධනයට බලපානු ලබන සාධක පිළිබඳ ගුරු ආකල්ප 130

ප්‍රස්ථාර අංක 4.9 අධ්‍යාපන සාධනයට සමාජ පන්තිය බලපාන ප්‍රධාන අවධීන් 135

ප්‍රස්ථාර අංක 4.10 දත්ත දායකයින් දරුවාට ඇති සම්බන්ධතාවය 136

ප්‍රස්ථාර අංක 4.11 පවුල් සංස්ථාවල ව්‍යුහය 138

ප්‍රස්ථාර අංක 4.12 පියවරුන්ගේ අධ්‍යාපන තත්ත්වය 139

ප්‍රස්ථාර අංක 4.13 මව්වරුන්ගේ අධ්‍යාපන තත්ත්වය 140

ප්‍රස්ථාර අංක 4.14 පියවරුන්ගේ රැකියා ක්ෂේත්‍රය 141

ප්‍රස්ථාර අංක 4.15 පෞද්ගලික අංශයේ රැකියාවන්හි නිරත පියවරුන්ගේ රැකියා තත්ත්වයන් 142

ප්‍රස්ථාර අංක 4.16 මව්වරුන්ගේ රැකියා ක්ෂේත්‍රය 143

ප්‍රස්ථාර අංක 4.17 මව්වරුන්ගේ රැකියා තත්ත්වයන් 144

ප්‍රස්ථාර අංක 4.18 නිවාසවල යටිතල පහසුකම්වල තත්ත්වය 148

ප්‍රස්ථාර අංක 4.19 නිවසේ විදුලි උපකරණ පාවිච්චි කිරීමේ තත්ත්වය 149

ප්‍රස්ථාර අංක 4.20 නිවසේ දැව භාණ්ඩ පාවිච්චි කිරීමේ තත්ත්වය 150

ප්‍රස්ථාර අංක 4.21 දරුවාගේ පාසල් ක්‍රියාකාරකම් සම්බන්ධ දෙමාපිය දායකත්වය 153

ප්‍රස්ථාර අංක 4.22 දෙමාපියන්ට දරුවන් පිළිබඳව පවත්නා ඉහළ ම බලාපොරොත්තුව 155

# රූප සටහන්

## දෙවැනි පරිච්ඡේදය

2.1 රූපය - අධ්‍යාපන සම්පාදනය හා මිනිසාගේ පූර්ණ සංවර්ධනය 13

2.2 රූපය - අධ්‍යාපනය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම 20

2.3 රූපය - අරමුණු සාධනය කර ගන්නා ආකාරය 22

2.4 රූපය - පුද්ගලයාගේ අධ්‍යාපන හා රැකියා තත්ත්වයන් කෙරෙහි විවිධ විචල්‍යයන්ගේ බලපෑම 48

# ස්තුතිය

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධාන එන්. ඩබ්ලිව්. ජයසුන්දර මහතාට ද
- නිබන්ධය සකස් කිරිමෙහිලා මාර්ගෝපදේශකත්වය පෙන් වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය බී.ඒ. ටෙනිසන් පෙරේරා ගුරු පියාණන්ට හා ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර ගුරු පියාණන්ට
- අවැසි පොත පත ලබා දෙමින් නිබන්ධය සකස් කිරිමෙහිලා ඉමහත් සහයෝගයක් ලබා දෙමින් සෝදු පත් කියවා අනුපමේය සේවයක් කළ ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු සහකාර අධ්‍යක්ෂ ජෙනරාල් ආචාර්ය ධම්මික බිබිලේ ගුරු පියාණන්ට ද
- නිබඳව ම අවශ්‍ය කරුණු පහදා දෙමින් උපදෙස් ලබා දුන් කැලණිය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය අනූෂා ඒදිරිසිංහ මහත්මියට ද
- දත්ත විශ්ලේෂණ කාර්යේදී නිසි මග පෙන්වමින් අවැසි සහයෝගය නිරතුරු ව ලබා දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ ව්‍යාපෘති නිලධාරි දුමින්ද පලිහක්කාර මහතාට ද
- අධ්‍යයනයට ලක් කළ සියලු පාසල්වල විදුහල්පතිවරුනට හා ගුරු භවතුනට ද
- ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී විශේෂ සහයෝගයක් ලබා දුන් කොට්ටාව ධර්මපාල මහා විද්‍යාලයේ අශෝකා මල්කාන්ති ගුරු මහත්මියට ද
- ප්‍රශ්නාවලිය සකස් කර ගැනීමේ දී සහයෝගය ලබා දුන් කොළඹ බිලුමැන්ඩල් සිංහල විද්‍යාලයේ ආචාර්ය වයන්ති මහත්මියට හා ප්‍රාථමික අංශයේ අංශ ප්‍රධාන ඩිෂාන්ති චම්පිකා මහත්මියට ද අවශ්‍ය සිතියම් නිර්මාණය කර දෙමින් සහය ලබා දුන් එම විදුහලේ ආචාර්ය ගයත්‍රී මෙනවියට ද
- පරිගණක අක්ෂර සංයෝජනය කර අවැසි සහය නොමද ව දුන් පියසා කොමියුනිකේෂන් ආයතනයෙහි ඉන්ද්‍රා රත්නායක සහ නිමාලි සංජීවනී සොයුරියන්ට
- නන් අයුරින් සහයෝගය ලබා දුන් ආදරණීය අම්මා, තාත්තා, චාමර ඇතුළු පවුලේ සැමට,
- නොයෙක් අයුරින් උපකාර කළ කසුනි, වින්ද්‍යා යන මිතුරියන්ට ද

මගේ හද පිරි ස්තුතිය පිරිනමමි.

# පළමුවැනි පරිච්ඡේදය

## 1. හැඳින්වීම

අධ්‍යාපන සාධනය හා සිසුන්ගේ සමාජ ස්තරායන පසුබිම අතර සම්බන්ධතාව සමාජ විද්‍යා පර්යේෂණවලට යොමු වී ඇති ප්‍රධාන කරුණකි. සමාජ ස්තරායනයේ පවත්නා විවිධත්වය දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි කොතරම් දුරට බලපාන්නේද? ඒ සඳහා මූලික වන කරුණු මොනවාද? යන්න විමසා බැලීමේ දී සමාජ විද්‍යාඥයින් මේ පිළිබඳ ව විශේෂ අවධානය යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් දැනට පවත්නා න්‍යායාත්මක කරුණක් වන්නේ පන්ති ස්තරායනයෙහි පහළ මට්ටම හා අධ්‍යාපන සාධනයෙහි පහළ මට්ටම සමඟ පවත්නා සම්බන්ධතාවයයි. එනම් ආර්ථික වශයෙන් දරිද්‍රතාවයෙන් පෙළෙන දරුවන්ගේ අධ්‍යාපනික සාධනය, ආර්ථික ගැටළු නොමැති පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනික සාධනයට වඩා පහළ මට්ටමක ඇති බවට සාධක පැවතීමයි. ඒ හැරුණුවිට පාසල් වර්ගය සහ ඒවායේ අධ්‍යාපනය ලබන සිසුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය අතර සමීප සම්බන්ධතාවක් ඇති බවත්, උසස් වර්ගයේ ජනප්‍රිය පාසල් ප්‍රභූ පන්තියේ දරුවන්ට වැඩි වශයෙන් අවස්ථා සලසා ඇති බවත්, සාමාන්‍ය පාසල් සමාජ තත්ත්වයෙන් පහළ සාමාන්‍ය ජනතාවගේ දරුවනට වැඩි වශයෙන් වෙන්ව ඇති බවටත් කරුණු හෙළි වී ඇත.

සංවර්ධනය වන රටවල ප්‍රාථමික පන්තිවල ශිෂ්‍ය සාධනය හා සමාජ ස්තරායනය සම්බන්ධ පර්යේෂණ තවමත් සිදුවන්නේ ස්වල්ප වශයෙනි. මෙහිදී කාර්මික රටවලින් ලද ප්‍රතිඵලවලට වඩා වෙනස් ප්‍රතිඵල සංවර්ධනය වන රටවලින් වාර්තා වී තිබේ. ළමුන්ගේ අධ්‍යාපන සාධනය හා සමාජ ස්තරායනය පිළිබඳ ව අපරදිග රටවල කරන ලද පර්යේෂණ අනුව හෙළිදරව් වී ඇත්තේ සමාජ පන්ති හා උප සංස්කෘතීන්ට අයත් සමාජවල වෙනස්කම් අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන බවය (Kirishnamurthi,1975:114). එසේම දරුවන්ගේ හැකියාවන් හා සමාජ පන්තිය අතර ඇති සබඳතාවය විමසමින් ඉහළ සමාජ පන්තිවලට අයත් දරුවන්ට අධ්‍යාපනයේ දී වැඩි වාසි සහගත තත්ත්වයක් ඇති බව ද සියලු ම දරුවන් එකම ද්‍රව්‍යයන් හා භාවිතයන් යොදා ගනු ලැබුව ද පහළ ස්තරවලට අයත් පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන සාධනය පහළ මට්ටමකට නැඹුරු ව ඇති බව හඳුනා ගෙන ඇත.

තව ද සැමට අධ්‍යාපනය යන පදනම යටතේ නිම කර ඇති පර්යේෂණවලින් අධ්‍යාපන අවස්ථා කෙරෙහි බලපාන සාධක හඳුනා ගෙන තිබේ. එම සාධක අතුරෙන් පවුල නියෝජනය කරන සමාජ ස්තරායනය ප්‍රබල සාධකයකි. මේ පිළිබඳව ලංකාවේ පර්යේෂණ කර ඇත්තේ අඩු තරමිනි. එනම් ජනවාර්ගිකත්වය, පන්තිය හෝ කුලයයි. ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපන රටාව තුළ විධිමත් අධ්‍යාපනයේ පළමුවන අවධිය ප්‍රාථමික හෙවත් මූලික අධ්‍යාපන අවධිය වේ. ලෝක මට්ටමෙන් සමස්තයක් ලෙස සැලකුවිට විධිමත් අධ්‍යාපනයේ මුල් අවධිය වයස අවුරුදු 05 ත් 07 ත් අතර වයසෙන් ආරම්භ වී වයස අවුරුදු 11 සහ 13 අතර කාලයක දී අවසන් වේ. ලොව විවිධ රටවල් ප්‍රාථමික අධ්‍යාපන අවධිය හඳුන්වන ආකාරය විවිධත්වයකින් යුත් නිසා ප්‍රාථමික අධ්‍යාපනය ආරම්භ වන නිශ්චිත වයස හා අධ්‍යාපන සාධන මට්ටම අතර ඇති සම්බන්ධතාවය ගැන මුළු ලෝකයට ම ගැළපෙන පොදු නිර්වචනයක් සැපයීම අපහසු ය. ඒ අනුව ප්‍රාථමික පාසලේ ශ්‍රේණි පරාසය වෙනස් වීම, ප්‍රාථමික අධ්‍යාපනයට අයත්වන කාලය වෙනස්වීම, ප්‍රාථමික ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ගේ වයස් මට්ටම්වල විවිධත්වය, වැනි කරුණු නිසා ප්‍රාථමික අධ්‍යාපනයට පැහැදිලි නිර්වචනයක් සැපයිම සඳහා නිශ්චිත සීමාවක් පැනවීම දුෂ්කර වී ඇත.

ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපන රටාව තුළ විධිමත් අධ්‍යාපනයට මූලික අඩිතාලම වැටෙන්නේ ප්‍රාථමික අධ්‍යාපනය තුළින් නිසා දරුවන්ට ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය කර තිබේ. මේ නිසා 1 වසර සිට 5 වසර දක්වා ශ්‍රේණිවල දරුවන් කුමන සමාජ ස්තරයකට අයත් වුව ද ප්‍රාථමික අධ්‍යාපනය ලබා ගත යුතු ව තිබේ. දළ වශයෙන් වයස අවුරුදු 5 සිට වයස අවුරුදු 10 දක්වා වයස් කාණ්ඩයේ ළමයින් විධිමත් අධ්‍යාපනය ලබනුයේ ප්‍රාථමික පාසලෙන් නිසා පහළ සමාජ ස්තරය අධ්‍යාපන සාධනය සඳහා බාධාවක් වීම වළක්වා ලීමට විවිධ පියවර ගෙන තිබේ. පාසල් පොත් ලබා දීම, නිල ඇඳුම් ලබා දීම, දිවා ආහාරය ලබා දීම, පහසුකම් ගාස්තු අය නොකිරිම මීට ඇතුළත් වේ. විශේෂයෙන් මෑතක දී කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලින් සෑම දරුවෙකුට ම අධ්‍යාපනයේ සම අවස්ථා ලබා දීම අවධාරණය කර තිබේ.

ඒ අනුව දරුවෙකු මුල් වසර පහ තුළ ලබන අධ්‍යාපනය ඉතා වැදගත් බව අධ්‍යාපනඥයින් පිළිගෙන ඇති බව මෙයින් පැහැදිලි වේ. ප්‍රාථමික අධ්‍යාපනයට පිවිසෙන දරුවාගේ ස්වභාවය කුමක් වුවත්, සමාජ පන්තිය කුමක් වුවත් සෑම දරුවෙකු ම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලින් යෝජනා කර ඇති අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනිම සඳහා අනුබල දිය යුතු වේ. ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දී ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට මුල්තැනක් ලබා දෙමින් සෙල්ලමින් ඉගෙනීමට අවස්ථා සැලසිමත්, අසුන් ගත වැඩවල දරුවා යෙදවීම ස්වල්ප වශයෙන් කිරිමටත් උපදෙස් දී තිබේ. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව සාක්ෂාත් කර ගත යුතු අරමුණු නවයක් සඳහන් වන අතර, නිපුණතා පහක් ද අවධාරණය කර තිබේ. (පිටු අංක 24 හි පැහැදිලි කර ඇත.) මේ අනුව ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දී දැනුම පමණක් නොව කුසලතා හා ආකල්ප වර්ධනයට ද අවස්ථාව සලසා ඇත්තේ සියලුම දරුවන්ගේ සාධන මට්ටම සම තත්ත්වයකට ගෙන ඒමට ය. මූලික අධ්‍යාපන අවධියේ දී අත්‍යවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප මනා ලෙස නොලැබුණහොත් පසුකාලීන ව අධ්‍යාපන කටයුතුවලට බාධා වන බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීම වී තිබේ. මේ නිසා එක් එක් ශ්‍රේණියේ දී අපේක්ෂිත සාධන මට්ටම පිළිබඳ ව නියමිත සම්මතයන්ට අනුව තක්සේරු කිරිමක් කරනු ලැබේ. එම තක්සේරුව අනුව අපේක්ෂිත සාධන මට්ටමට පැමිණ නොමැති නම් එම ශිෂ්‍යයින් අපේක්ෂිත සාධන මට්ටමට ගෙන ඒම සඳහා ක්‍රියා කිරිම වැදගත් කොට සැලකේ.

වර්තමානයේ ශිෂ්‍යයෙකුගේ සාධන මට්ටම නිශ්චය කරනු ලබන්නේ නිපුණතා පාදක විෂය මාලාව අනුවය. එබැවින් ඒ ඒ පන්තිවල දී දරුවකුගේ අපේක්ෂිත සාධන මට්ටම මැන බැලීම සඳහා නව විෂය මාලාව නිර්මාණය කර ඇත්තේ මෙම නිපුණතා කොතරම් දුරට සාක්ෂාත් කරගෙන තිබේදැ'යි මැන බැලීම සඳහා කරනු ලබන තක්සේරු කිරිමක් මගිනි.

කෙසේ වුව ද දරුවෙකුගේ අධ්‍යාපන සාධනය සඳහා බලපාන සාධක විවිධ වේ. දරුවා ජිවත්වන පරිසරය, පවුල් පසුබිම, දෙමාපිය අධ්‍යාපන මට්ටම, දෙමාපිය වෘත්තීන්, දෙමාපිය ආකල්ප, සමාජ පරිසරය, ඇසුරු කරන සම වයස් කණ්ඩායම්, පුද්ගල ශක්‍යතාවන් මෙන්ම, පාසල්වල පවතින සම්පත්වල ප්‍රමාණය හා ස්වභාවය, සම්පත් බෙදී යන පිළිවෙළ, විෂය